## මගෙන් වචනයක්..

සමහර යාලුවො කියනවා නේ ජීවිතෙ දිනන්න විභාග පාස් වෙන්නම ඔනි නෑ කියල.මෝටිවීශන් අයියල අප්පච්චිලා එම.හරි ඇති.

ඉතින් විභාග ෆෙල් වුන හැම මිනිහම ජීවිතෙ දිනුවද බං ? ඔයා හිතනවද ඔයාගෙ අනික් යාලුවො පාස් කියල කියද්දි ඔයා ෆෙල් කියල හරි ඔයා අඩු සාමාර්ථ අරන් තියෙද්දි හරි ඔයාට දැනෙන හැගීම ලස්සන එකක් වෙයි කියල..ඔයාගෙ අම්මට අප්පච්චිට දැනෙන හැගිම ලස්සන එකක් වෙයි කියල.

එක එකාගෙ වැල් බයිලා වලට යට වෙන්-නැතුව ඔයාගෙ ජීවිතේ අඩියක් හරි ඉස්සරහට එන්න හොදට විභාගේ ගොඩ දාගන්න.ජයග්‍රහණය නෙමෙ සහභාගි වීම වැදගත් කියන තර්කෙට වැඩ කරන්නෙ-පා.සහභාගි වෙලා ෆෙල් ලකුනක් අරන් වැඩක් නෑ.හැමෝම හිනාවෙයි.ඉතින් සහභාගි වෙලා ජයග්‍රහණය අරන් පෙන්නන්න.අඩුම උත්සහා කරන්න.

ඔයාට ජයෙන් ජය පොඩ්ඩො.!!

Advanced level 2023

# මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම තිතටම මීඩියා



නව වැනි පාඩම

# සංවර්ධනය සඳහා සන්නිවේදනය

Communication for development

විස්තරාත්මක කෙටිසටහන් පොත

Advanced level 2023

මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම තිතටම මීඩියා

විස්තරාත්මක කෙටිසටහන් පොත

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

ලහිරු කේ. මදුශාන්

HNDIT , mass communication (UG)

076 3950730

071 0538308

# 09. සංවර්ධනය සඳහා සන්නිවේදනය

සංවර්ධනය සඳහා සන්නිවේදනය යනු තිරසර ප්‍රජාතන්ත්‍රික සංවර්ධනයට අදාළ ව සමාජයේ සිදුවිය යුතු සියලු ආකාරයේ සන්නිවේදන වෙත යොමු වන පුළුල් අර්ථයක් සහිත යෙදුමකි.

## සංවර්ධන නිර්වචන

සංවර්ධනය යනු රටක දුප්පත්කම අසමානතාව හා විරැකියාව අඩු කිරීම හෝ අහෝසි කිරීමයි.
ඩඩ්ලි සියර්ස්(1969)-

සංවර්ධනය යනු මිනිසුන්ගේ සංවර්ධනය (මානව සංවර්ධනය) මිස ද්‍රව්‍යමය සංවර්ධනයක් නොවේ
එඩ්ගා ඕවන්ස්( 1987 )

සංවර්ධනය යනු පූර්ණ සමාජ සංවර්ධනය. එයට මානසික ආධ්‍යාත්මික සහ ද්‍රව්‍යමය අවශ්‍යතා ඇතුළත් වේ
මහත්මා ගාන්ධි '

**සංවර්ධනය සඳහා සන්නිවේදනය**

1. සංවර්ධනය සඳහා සන්නිවේදනය යනු සංවාදය සක්‍රීය කරවන ද්වි මාර්ගික සන්නිවේදන පද්ධති මගින් ප්‍රජාවන්ට ඔවුන්ගේ අභිලාෂ හා උත්සුක ප්‍රකාශ කිරීම ට හැකි හා ඔවුන්ගේ ම සංවර්ධන ක්‍රියාවලියක අදාළ තීරණ වලට සහභාගීව මැදිහත් වීමයි.
-එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය-(1996)

2. සංවර්ධනය සඳහා සන්නිවේදනය යනු පුළුල් පරාසයක මෙවලම් හා ක්‍රම භාවිතා කරමින් සංවාදය මත පදනම් වූ සමාජ ක්‍රියාවලියකි. එසේ ම දැනුම නිපුණතා බෙදා හදා ගැනීම ගොඩනැගීම මෙන්ම ප්‍රතිපත්ති විවාද සහ ස්ථිරසාර වූ සංවර්ධනයක් සඳහා සවන්දීම විශ්වාසය ගොඩනැගීම හා විවිධ මට්ටම් වල වෙනස්කම් හඳුනා ගැනීම යි. එය මහජන සම්බන්ධතාව හො ආයතනික සන්නිවේදනය නොවේ.
සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳ රෝම සම්මුතිය-(2006)

3 ගෝලීයකරණ සංදර්භයෙහි සංවර්ධනය සඳහා සන්නිවේදන භාවිතය යනු සමාජ වෙනස්කම් සඳහා ක්‍රියාවලි ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රමයකි
'ස්වීඩනයේ මැල්බෝ විශ්වවිද්‍යාලය'

**සිල්වියෝ වයිස්බොඩ් සංවර්ධනය සඳහා සන්නිවේදනය ප්‍රායෝගික භාවය සම්බන්ධයෙන් ප්‍රධාන අදහස් 5 ක් හඳුනාගෙන තිබේ.**

1.කේන්ද්‍රගත බලය ශක්තිමත් කිරීම
2.ඉහල පහළ හා පහළ ප්‍රවේශය ඒකාබද්ධ කිරීම
3.සන්නිවේදන මෙවලම් භාවිතා කිරීම
4.පුද්ගලාන්තර සන්නිවේදනය හා ජන සන්නිවේදනය අතර සමබරතාවය නිර්මාණය කිරීම
5.පුද්ගල හා සමාජ හැසිරෙන වෙනස් කිරීමේ වැඩසටහන් වලට ප්‍රමුඛතාව දීම

**ශ්‍රීනිවාස් මෙල්කොට් සංවර්ධනය සඳහා සන්නිවේදනය යනු**

විචාරාත්මක සිද්ධාන්ත මගින් මානව සමාජ ගැටලුවලට විසඳුම් සැපයීම
මිනිසාගේ ඉතිහාසය ක්‍රියාවලියක් බව වටහා ගැනීම
ආගමික බැඳීම් වලින් තුන්වන වන ලෝකයේ විමුක්තිය ලබාගැනීම
සන්නිවේදනය සහ සමාජ ව්‍යුහය පිළිබඳ සම්බන්ධතා වැඩි දියුණු කිරීම
3 වන ලෝකයේ සංවර්ධනය සඳහා සන්නිවේදනය වැඩි දියුණු කරගැනීම පිණිස වූ යෝජනා හා ඒවා සිදු කළ ගැක්කේ කෙසේ ද යන යාන්ත්‍රික ප්‍රශ්න ඇසුරෙන් පමණක් අවශ්‍ය තහවුරු කර ගැනීමට නොහැකි බව වටහා ගැනීමයි.

## සංවර්ධන සංකල්පයේ නව ප්‍රවණතා

**මුල් යුගය** ( 1950 -1970).
ඇමරිකානු සමාජ විද්‍යාඥයන් විසින් සංවර්ධන සන්නිවේදනය විද්‍යාත්මක සංකල්පයක් ලෙස ගඳුන්වනු ලැබූ නවීකරණ න්‍යායට අදාළ ඉහළ සිට පහලට සන්නිවේදනය පිළිබඳ පැවති ප්‍රවණතා ප්‍රධාන වශයෙන් වෙනස් වී ඇත.

නවීකරණ න්‍යාය මගින් දියුණු රටවල් නූතනත්වයට පත් නොවන්නේ මන්ද යන්න මත දරිද්‍රතාවයට විසඳුමක් ලෙස ධනේශ්වර සාරධර්ම ව්‍යාප්ත කිරීම මගින් කොමියුනිස්ට් වාදය ව්‍යාප්තිය කිරීමට යොජනා කරන ලදි.

දියුණු රටවල ආර්ථිකය මන යැපීමෙන් නොදියුණු රටවල් දියුණු කරගත හැකි බව පරායත්තතා න්‍යාය මගින්පෙන්වවා දෙනු ලැබීය. (ලතින් ඇමරිකාව හා කැරිබියන් ආර්ථික කොමිසම -' 1950)

**මධ්‍ය යුගය** ( 1970 සිට 1990)
එවරට් රොජර්ස් 1962 දී නවෝත්පාදන විසරණයණි හදුන්වා දෙනු ලැබී ය. එය නව අදහස් හා තාක්ෂණික ව්‍යාප්තිය කෙසේද? කවර කරුණක් සඳහාද? කුමන වේගයකට අනුවද? යනාදිය අවබෝධ කර ගැනිමට වැදගත් න්‍යායකි. සංවර්ධන සංකල්පය ජන ගත කිරීම සඳහා රොජර්ස් නවීකරණය සන්නිවේදන නාලිකා කාලය හා සමාජ පද්ධති කෙරෙහි අවධානය යොමු කළ යුතු බව දක්වයි.

**වර්තමාන යුගය**
නව විශ්ව නොරතුරු හා සන්නිවේදන ප්‍රඥප්තිය විසින් සංවර්ධනය සඳහා සන්නිවේදනය යන්න ප්‍රධාන බලවේගයක් බවට පත්කරන ලදි.

එමගින් පැරණි සංවර්ධන සන්නිවේදනය යන්න විවේචනයට ලක් කරමින් සංවර්ධනය සඳහා විකල්ප ප්‍රවේශ සොයා ගැනිණි. බලය හා සංස්කෘතිය යන සාධක දෙක සංවර්ධනය සඳහා සන්නිවේදනයට එකතු විය.

වර්තමානයේ පුද්ගලාන්තර සන්නිවේදනය ප්‍රායොගිකත්වය සහභාගීත්වය හා දැනුම් හුවමාරුව කෙරෙහි අවධානය යොමු කොට තිබේ.

තොරතුරු ප්‍රවේශය දැනුමට විවෘත ප්‍රවේශය උපාය මාර්ගික සන්නිවේදනය, සහභාගීත්ව සන්නිවේදනය, සංස්කෘතිය මාධ්‍ය තොරතුරු සන්නිවෙදන, යටිතල පහසුකම්, තාක්ෂණය ආදී ක්ෂේත්‍ර බල ගැන්වීම මෙහි දී වැදගත් කොට සලකන ලදි.

ද්වි මාර්ගික සන්නිවේදකයා තිරස් සන්නිවේදන මාර්ග, මහජන සවන් දීම්, විවාද, සාකච්ඡා, පාර්ශවකරුවන්ගේ උපදේශන, සහභාගීත්ව ගුවන්විදුලි සහ වීඩියෝ වැඩසටහන් ප්‍රජා පාදක නාට්‍ය හා කතා සහ වෙබ් සංසද යනාදිය ද මීට අයත් ය.

ස්ථිරසාර සංවර්ධනය සඳහා සන්නිවේදනය සංවර්ධනය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය යනාදිය සංවර්ධනය සඳහා සන්නිවේදනයේ පුළුල් කොටසක් බවට පත්විය.

මෙලෙසින් සංවර්ධන සන්නිවේදනය යන මානවවාදය සංවර්ධනය සඳහා සන්නිවේදනය ලෙස විතැන් විය. එමගින් සංවර්ධනය යන්නට සේම සන්නිවේදනය යන්නට ද ප්‍රමුඛතාවයක් ලැබිණි.

සංවර්ධන සඳහා සන්නිවේදනයණි යන ක්‍රියාකාරකම් මගින් සංවර්ධන ප්‍රතිපත්තිවලට හා ක්‍රියාදාමවලට අනුකූලව නිර්මාණය කිරීම මගින් සමාජීය සංවාද දිරි ගැන්වීමයි.

## 9.2 සංවර්ධන සංකල්පයේ ස්වභාවය

භූගෝලීය, සංස්කෘතික, සමාජීය සහ ආර්ථික සන්දර්භවල විවිධාකාර දිශා ඔස්සේ සංවර්ධනය උදෙසා සන්නිවේදනය පුළුල් ලෙස භාවිතා කිරීම මෙම සංකල්පයේ මුඛ්‍ය අරමුණ වේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානය අන්තර් සම්බන්ධිත සංවර්ධනය සඳහා සන්නිවේදන ප්‍රවේශ 4ක් ප්‍රකාශ කරයි.

හැසිරීම් වෙනස්කම් සඳහා සන්නිවේදනය
සමාජීය වෙනස්කම් සඳහා සන්නිවේදනය
නියාමනය සඳහා සන්නිවේදනය
පාරිසරික සමතුලිතතාව සඳහා සන්නිවේදනය

සංවර්ධනය සඳහා සන්නිවේදන සංකල්පයට අයත් වැදගත් මාතෘකා කිහිපයකි.

### ජනතා කේන්ද්‍රීයතාව

සංවර්ධනය සඳහා ජනතාව මූලික කරගත් ඒකාබද්ධ මූලෝපායික ප්‍රවේශ හඳුනා ගැනීමේ ක්‍රියාවලිය මෙ නමින් හඳුන්වයි.

ජනතා කේන්ද්‍රීය සංවර්ධනය සඳහා සන්නිවේදන මූලධර්ම කිහිපයක් මෙසේ පෙළ ගැස්විය හැකිය.

යහපැවැත්ම ප්‍රවර්ධනය,පුද්ගල කේන්ද්‍රීය රැකවරණය සහ සමස්ථ පුද්ගල රැකවරණ කෙරෙහි අවධානය යොමු කිරීම.
හවුල්කාරත්වය සහ සහභාගිත්වය
සමාජ/ සංස්කෘතික විවිධත්වය පිළිබඳ ව සංවේදීතාව
මාධ්‍ය පරිශීලකයන් අතර සම්බන්ධතා සහ ගුණාත්මකභාවය
පුද්ගල අවශ්‍යතා සඳහා ප්‍රතිචාරාත්මක රැකවරණය
අඛණ්ඩ පෞද්ගලික සම්බන්ධතා
අයිතීන් සහ වගකීම්

### ප්‍රාදේශීයකරණය

1.ප්‍රාදේශීයකරණය යනු සංවර්ධනය ඒ ඒ රටවලට ගැලපෙන ලෙස ඒ ඒ රටවලට ම සකස් කර ගැනීමයි.
2.මෙහිලා ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී දරිද්‍රතාවය අවම කිරීම සහ ආර්ථික වර්ධනය පිළිබඳ ගැටලු විසඳීම පිළිබඳ මතවාදය ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට ගනියි.
3.සමාජයීය සම්බන්ධතා හා සමානාත්මතා ගොඩනැගීම.
4.සමාජ සම්බන්ධතාව ගණයට පහත සඳහන් දෑ අයත් වේ
5.තමන්ගේ ම සමාජ ක්‍රියාවක් නිර්මාණය කිරීම මගින් අන් අයගේ ක්‍රියා වටහා ගැනීම
6.අන්තර්ක්‍රියා සම්බන්ධීකරණය නමන්ගේ ම ඇගයුම සහන සැලසුම
7.අර්ථවත් අභිප්‍රේරණය ගා සියලුම ආකාරයේ සමාජ අන්තර් ක්‍රියා සංවිධානය කිරීම.
8.සමානාත්මතාව

18 වන සියවසේ ප්‍රංශ විප්ලවය ගා ඇමරිකානු නිදහස් සටනේ දී සමානාත්මතාව පිළිබඳ සංකල්පය ඉදිරියට පැමිණින.

සමානාත්මතාව යනු සමාජයේ පුළුල් වෙනස්කම් ඉවත් කිරීම, විශේෂ වරප්‍රසාද අවසන්කිරීම, හැකියා පදනම මත සමාන අවස්ථා ලබා දීම සහ පුද්ගලයන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා විධිවිධාන සැලසීමයි.

සමාජීය සම්බන්ධතා හා සමානාත්මතා ලක්ෂණ

විශේෂිත මානව අයිතිවාසිකම නොමැතිවීම
සංවර්ධනය සඳහා සමාන අවස්ථා පැවතීම
අවම අවශ්‍යතා සම්පූර්ණ කිරීම
පන්ති බෙදීම තුරන් කිරීම
සාධාරණ හේතු මත වෙනස්කම් කිරීම

## දරිද්‍රතාවය අවම කිරීම

1990 දශකයේ දී ජාත්‍යන්තර සංවර්ධන චින්තනයේ කේන්ද්‍රීය අවධානය දිළිදුකම අඩු කිරීම බවට පත්විය.

## දරිද්‍රතාවය පිටු දැකීම සඳහා

1 ස්ථිරසාර ජීවනෝපාය ව්‍යවසායික අවස්ථා සහ ඵලදායී සම්පත් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම
2 මූලික සමාජ සේවාවලට විශ්වීය ප්‍රවේශ සැපයීම
3 තමන්ගේ ම ශක්තියෙන් නැගී සිටිය නොහැකි අයට උපකාර කිරීම සඳහා ප්‍රවේශ වැඩි දියුණු කිරීම
4 දරිද්‍රතාවයෙන් ජීවත්වන ජනතාව සහ ඔවුන්ගේ සංවිධාන බලගැන්වීම
5 දරිද්‍රතාවේ අසමානතා බලපෑමට ගොදුරු වන කාන්තාවන්ට විසඳුම් ලබාදීම
6 දරිද්‍රතාව පිටුදැකීමට සංවර්ධනය සඳහා සංනිවේදනයේ වැඩි කොටසක් වෙන් කිරීම සහ ඒ සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම

## ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ජනතාව මැදිහත්වීම

එක් එක් පුද්ගලයාගේ ගැටළුව පිළිබදව වඩා හොඳ අවබෝධයක් ලබා සහභාගි වන්නන්ගේ ගැටළු, ඔවුන් ඉදිරිපත් කරන කරුණු, අදහස්, අද්දැකීම් දැනුම අදහස් මනාප අපේක්ෂා සහ වටිනාකම් හුවමාරු කරගැනීම ට ද සහභාගි වන්නන්ට ඉඩ සලසා දීම මෙයින් අදහස් වේ.
ඒ සඳහා,

රාජ්‍ය හිමිකාරිත්ව මාධ්‍ය වෙනුවට වඩාත් ඵලදායි මාධ්‍ය යොදා ගැනිම.

ධනවාදයේ සහ වැඩවසම්වාදයේ බාධක ඉවවන් කිරීම මගින් සම්පත් මහජන අයිතිය වෙනුවෙන් උපයෝගි කර ගැනිම.

පොදුමිනිසාගේ මූලික අවශ්‍යතා හා බැදි මහා පරිමාන නිෂ්පාදන සඳහා සැලසුම් කිරීම.

ආර්ථික වශයෙන් පසුගාමී රටවල ආර්ථික සංවර්ධනය සිදු කළ හැක්කේ
විකල්පයකින් නොව මහජනතාවට පමණක් බව අවධාරණය කිරීම.

නවින තක්ෂණය ජනනාව සංවර්ධනය වෙනුවෙන් සැලසුම් කිරීම ආදි කාර්ය සිදු කළයුතුය.

## 9.3 සංවර්ධන සඳහා සංනිවේදන අවශ්‍යතා

සංවර්ධනය සඳහා සන්නිවේදන අවශ්‍යතා යනු සන්නිවේදන ක්‍රියාවලිය හා ඔවුන්ගේ ම අවශ්‍යතා පිළිබඳ පූර්ණ දැනුවත් බවක් ලබා දීමත් වෙනස්කම් සඳහා විකල්පණී ගැටළු විසඳාගැනීමණී සම්මුතික ව කටයුතු කිරීමණී තිරසර සංවර්ධනය සඳහා ක්‍රියා-ාකාරකම් සැලසුම් කිරීමණී ජනනාවගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතා අත්පත් කර ගැනිම හා ආයතනික කාර්යක්ෂමතාව යනාදියෙහි වැදගත්කම කියා පෑමත්‍ය.

ලොක මට්ටමේ ආයතන ලොක මට්මමේ ආයතන කිහිපයක් සං-වර්ධනය සඳහා සන්නිවේදන අවශාංතා කෙරෙහි තම අවධානය යොමු කර ඇත.

1. ආහාර හා කෘෂිකර්ම සංවිධානය සංවර්ධනය සඳහා සන්නි-වේදනය කෙරෙහි අංශ තුනකින් අවධානය යොමු කරයි.
කෘෂිකාර්මික නවොඅත්පාදන සහ ආහාර සුරක්ෂිතතාව සඳහා ග්‍රාමීය සන්නිවේදන පද්ධති සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම.
ප්‍රජා මූලික ග්‍රාමීය ගුවන් විදුලි වැඩසටහන් කිරීම.
ප්‍රජාපාදක ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ දේශගුණික විපර්යාස වලට අනුවර්තනය වීම.

2. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනණී විද්‍යාව හා සංස්කෘතික සංවිධානය
සමාජ ගොඩනැංවීම සඳහා පුද්ගලයින් සහ ප්‍රජාවන් බලගැන්විය හැකි
සාධාරණ සුදුසු ගහා දැරිය හැකි ප්‍රවේශ මගින් සියලු දෙනාට ම සන්නිවේදන සහ තොරතුරු ලබා දීම

3. යුනෙස්කො ආයතනය සංවර්ධනය සඳහා සන්නිවේදන මාර්ග උපදේශන මූලධර්ම
වෙනස්කම් සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කරන සහභාගිත්වය ඇති කිරීම.
ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රමුඛ ධාරාවක් බවට පත් කරලීම.
සාධාරණත්වය. විවිධත්වය සහ ඉවසීම දියුණු කිරීම.

## මාධ්‍ය ගුණාත්මකභාවය

සමාජයේ මාධ්‍ය වැඩි දියුණු කිරීමට දරන ප්‍රයත්න මෙමගින් අදහස් වේ. නිදහස් හා ස්වාධීන මාධා වලට සහය දීම මගින් ප්‍රජාතන්ත්‍ර-වාදය සහ ඵලදායි ප්‍රජාතන්ත්‍රවාදී කතිකාවේ මාධ්‍යවල ගුණාත්මක භූමිකාව ඉටු වේ.

සහභාගිත්වය හා පුද්ගලාන්තර සම්බන්ධතා ශක්තිමත් කිරීම

මෙහිදි සාකච්ඡා හා මැදිහත්වීම් සවිබල ගැන්වීම පුද්ගලයන් සහ කණ්ඩායම් සවිබල ගැන්විම නායකත්වය හා උපදේශන කුසලතා ශක්තිමත් කිරීම සහ ස්ත්‍රී විෂමතා ප්‍රචලිත වචන ප්‍රමිති හා භාවිත වල විකල්ප ප්‍රවර්ධනය කිරීම අදාළ වේ. මේ සඳහා පහත කාර්ය-යන් සිදු කිරීම වැදගත් වේ.

සහභාගින්ව සන්නිවේදන වැඩසටහන් කිරීම

ධනාත්මක වෙනසකම් පිළිබඳ ව සංවේදී සංවාද මගින් ප්‍රජා සාමාජිකයන්ගේ සහභාගිත්වය ඇති කිරීම

හැකි සෑම විටම සහභාගිත්ව අධීක්ෂණ සහ ඇගයුම් ප්‍රවේශ ලේඛනගත කිරීම හා ඇගයීම

කාන්තාවන් සහ ගැහැණු ළමයින් අතර සංස්කෘතික වශයෙන් සංවේදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

වැඩි ප්‍රජා සහභාගිත්වයක් සහිත සන්නිවේදනයක් ඇති කිරීම.

**අත්‍යාවශ්‍ය මානුෂීය තොරතුරු සම්පාදනය**
මූලික මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම හා මානුෂීය ගුණධර්ම පෝෂණය මෙමගින් අදහස් කෙරේ. පුද්ගලයන් සෑම දිනකම තීරණ ගන්නා අතර අප සිතන හා විශ්වාස කරන දේ මත පදනම්ව ජීවන ක්‍රියා සිදු කරනු ලැබේ.

ප්‍රතිසංස්කරණ වලට මැදිහත්වීම, සහජීවනය හා ගැටුම් නිරාකරණය

නව නීති හා ව්‍යවස්ථා සංශෝධන හා පුරවැසිභාවය පිළිබඳ අර්ථකථන සකස් කිරීමට මහජනයා ප්‍රතිසංස්කරණයට මැදිහත්වීම අත්‍යවශ්‍ය වේ. එමගින් ආණ්ඩුවල වගකීම් නැවත අර්ථ දැක්වීමක් සිදු වේ.

රටක සිදු කරන සියලු ප්‍රතිසංස්කරණවල ට ජනයා මැදිහත්වීම අනවශ්‍ය වේ.සහජීවනය සඳහා වූ සන්නිවේදනය යනු මිත්‍ර සබඳතා යළි යළිත් තහවුරු කිරීමයි.

ආයතනික අඛණ්ඩතාවණී දෝශපාලනණී ව්‍යාපාරික සහ ප්‍රජා ව්‍යුහ විසින් ප්‍රතිසංස්කරණ වලට ක්‍රියාකාරී සහයෝගය ලබාගත යුතුය.

සහජීවනය. සංස්කෘතිය හා උරුමය ජාතික අනන්‍යතාවය එක වටිනාකම වන බැවින් එහි ප්‍රතිඵලයක් ලෙස සහජීවනය පවතී.

**ගැටුම් නිරාකරණයේ පියවර**

ගැටුම් තේරුම් ගැනීම
ප්‍රතිපක්ෂය සමඟ සන්නිවේදනය කිරීම
කළ හැකි යෝජනා ඉදිරිපත් කිරීම
හොඳම විසඳුම තෝරා ගැනීම
තෙවන පාර්ශවීය මැදිහත්කරුවකු භාවිතා කිරීම
විකල්ප සොයා ගැනීම

**ගෝලීය සංවර්ධනය**
ගෝලිය සංවර්ධනය යනු ජාත්‍යන්තර මට්ටමේ සංවර්ධනයේ පුළුල් සංකල්පයකි. ගෝලිය සංවර්ධන වෙනස්කම් පිළිබඳ හේතු සහ ක්‍රියා පිළිබඳ සාකච්ඡා මෙන්ම තිරසර සංවර්ධනය මගින් ගෝලිය වෙනස්කම් කළමනාකරණය කිරීමේ ක්‍රමයකි.

තාක්ෂණය, නවෝත්පාදනය ආදිය ව්‍යාප්ත කිරීම, ව්‍යාපාර සමාජය, සංස්කෘතිය, දේශපාලනය, භාණ්ඩ, සේවා හා මිනිසුන්ගේ සංචලන ආදිය මෙහිදී නිරීක්ෂණය කෙරේ.

**සංවර්ධන ව්‍යාපෘති**
සංවර්ධනය සඳහා සංවර්ධන ව්‍යාපෘති සැලසුම්කරණය පිළිබඳ මූලික අවබෝධය මෙමගින් ඉදිරිපත් කෙරේ.

සංවර්ධනය සඳහා සන්නිවේදන ව්‍යාපෘති වාර්තා අදියර
1.සන්නිවේදනය සඳහා ආරම්භක හේතු හඳුනා ගැනීම
2.සංවර්ධනය සඳහා සංවර්ධන වැඩපිළිවෙළ සැලසුම් කිරීම
3.සංවර්ධනය සඳහා සංවර්ධන ක්‍රියාකාරකම් නියම කිරීම
4.සංවර්ධනය සඳහා සන්නිවේදන දර්ශක නිර්ණය කිරීම
5.වියදම් ඇස්තමේන්තු කිරීම

## 9.4 සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා හඳුනා ගැනීම.

සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා යනු සංස්කෘතිය මාධ්‍ය සන්නිවේදනය සහ සංවර්ධනය පිළිබඳ අන්තර් විෂය ක්ෂේත්‍රයකි.

මෙහිදී ගෝලිය හා දේශිය සන්දර්භවල සියලු සමාජිය වෙනස්කම් ගවේෂණය කෙරේ.තොරතුරු සන්නිවේදනය, අධ්‍යාපනය, හැසිරීම් වෙනස් වීම්,සමාජ අලෙවිකරණය, මාධ්‍ය ආචාරධර්ම, සමාජ වෙනස්කම් සඳහා සන්නිවේදනය සහ ප්‍රජා සහභාගිත්වය ආදිය මගින් ජන අපේක්ෂා ඉටුකර ගැනීමේ ක්‍රියාදාමයක් සංවර්ධනය සඳහා සන්නිවේදන අපේක්ෂා යන්නෙන් යොජනා කෙරේ.

**අවශ්‍යතා කේන්ද්‍රීයත්වය**
සෞඛ්‍ය සේවා, පෝෂණය. සනීපාරක්ෂාව, මානව ගිමිකම් සහ නවාතැන් අවශ්‍යතා ඉටුකරගැනීමට සංවර්ධනය සඳහා සන්නි-වේදනය පුළුල් ලෙස උපයෝගී කර ගැනීම අවශ්‍යතා කේන්ද්‍රීයත්-වය යන්නෙන් අදහස් කෙරේ.

**ස්වයං නිර්ණය**
ස්වයං නිර්ණය යන, මිනිසුන් තමාගේ පුද්ගල අවශ්‍යතා සම්බන්ධ ප්‍රවණතා හා මනෝවිද්‍යාත්මක අවශ්‍යතා සැලකිල්ලට ගෙන,මානව අභිප්‍රේරණය සහ පෞරුෂය පිළිබඳ අවබෝධයෙන් යුතුව ක්‍රියා කිරීමයි.ස්වයංනිර්ණය යනු මානසික යහපැවැත්ම වැදගත් අංගයකි

ඒ සඳහා,
**ස්වාධීනත්වය**
තමන්ගේ ම හැසිරීම පාලනය කිරීම ට නමන් සිටින බව සිතීම කෙරෙහි මිනිසුන්ට ඇති අවශ්‍යතාවය.

**නිපුණතාව**
නම අවශ්‍යතාණී දැනුම සහ කුසලතා ගොඩනැගීමට වැදගත් වන කාර්ය පිළිබඳ විශාරදත්වවය වර්ධනය කිරීමට ඇති අවශ්‍යතාව

**සම්බන්ධතාව**
මිනිස්සුන්ට අනෙකෙකු සමග යම් ප්‍රමාණයක සම්බන්ධතාවක් අවශ්‍ය බව සිතීමට ඇති අවශ්‍යතාව

**ස්වයං විශ්වාසය**
තමා විසින් ම සංවර්ධන කරුණක් සම්බන්ධව අභ්‍යන්තර හේතු හෝ මූල හෝ විමසීමෙන් ඇති කරගනු ලබන විශ්වාසය යි. දිගුකාලීන සමාජ,දේශපාලනික, ආර්ථික ආදී වර්ධන සහ ඵලදායීතාව පිළිබඳ අවබොධ කර ගැනීමට ස්වයං විශ්වාසය ප්‍රයෝජනවත් වේ.

ඵලදායීතාව හා සංවර්ධනය සඳහා පහසුකම් සපයන බලවේග ක්‍රියා කරන්නේ කෙසේද? ස්ථාවර රාජ්‍යවල සංවර්ධන ප්‍රවණතා උදාසීන කරන යාන්ත්‍රණ මොනවාද? ප්‍රාග්ධනය සහ දැනුමෙහි බලවේග සක්‍රිය කළ හැක්කේ කෙසේද? සමාජ පද්ධතිවල පවතින සැඟවුණු ආර්ථික ක්‍රමෝපාය මතු කරන්නේ කෙසේද? යන්න තමන් විසින්ම විමසනු ලබයි

**යහපත් පරිසරයක් ගොඩනැගීම**
එනම් පරිසර විද්‍යාත්මක සමබරතාවයයි. යහපත් පරිසරය-ක් ගොඩනැගීම තුළින් සුහදශීලී සබඳතා, නිරොගී හා ප්‍රියජනක පාරිසරික සමතුලිතතා නිරූපණය කරයි.

සියලුම ජීවීන්ගේ පැවැත්මට ප්‍රමාණවත් ආහාර ලබා ගැනීම සහ ඔවුන්ගේ ස්ථාවරත්වය මගින් පාරිසරික සමතුලිතතාවය ඇති බව පිළිබිඹු වේ. සියලුම ජීවින්ගේ සංහිදියාව ස්ථාවර කරන පරිසර පද්ධතියෙහි සිදු වන ප්‍රභාසංස්ලේෂණය හොද පරිසරයක් ගොඩනැගිමට දායක වේ. මෙලෙස සියලුම ජීවින්ගේ පැවැත්මට පාරිසරික සමතුලිතතාව හේතු කොට ගෙන සිදු කෙරේ.

සම්පත් සුරාකෑම, වනාන්තර විනාශය වැළැක්වීම වැනි මානව ක්‍රියාකාරකම් වෙහෙසී පරික්ෂා කෙරේ. රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමණී වනාන්තර විනාශය වැළැක්වීමෙන් දේශගුණීක විපර්යාස වැළකේ.

ආපදා සන්නිවේදන ක්‍රියාකාරකම් මෙහිලා වැදගත් වේ.

**සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය**
එනම් සංවර්ධනය සඳහා සන්නිවේදනය මගින් ප්‍රජාතන්ත්‍රවාදී සවිඥානත්තනය ඉහළ දැමීම සහ ප්‍රජා සහභාගීත්වය වර්ධනය කිරීමයි.

විද්‍යුත් තාක්ෂණය මගින් පුරවැසි දේශපාලන ක්‍රියාකාරීත්වය දියුණු කිරීමට යෝජනා කරයි.

එසේම සමාන අරමුණු හෝ හා ඉලක්ක ඇති පුද්ගලයන්ට සමාන මනසක් ඇති පුද්ගලයන් හමුවීමට හා ගැටලු සාකච්ඡා කිරීමට ඇඅනථ්‍ය සන්නිවේදනය. යොදා ගත හැකිය. මෙමගින් ප්‍රජා සහභාගීත්වය ද වැඩි කරගත හැකිය.

පැරණී මාධ්‍ය ධුරාවලියේ ප්‍රකාශය සඳහා වු බාධක වළකා අත්ථ්‍ය සන්නිවේදනය මගින් ප්‍රජාතන්ත්‍රවාදි ප්‍රජා සහභාගිකත්වය වැඩි දියුණු කර ගත හැකිය.